RARE



710

FACULTY OF GRADUATE STUDIES
R
20 MAR 2012
UNIVERSITY OF KELANIYA

# කඩවර ඇදහිල්ල හා කඩවර කංකාරිය

( ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත කඩවර අභිචාර විධි හා ඒවායේ අන්තර්ගත ගායන වාදන හා නර්තනාංග පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයකි.)

සුමතිපාල ශිල්පාධිපති
ලලිතකලාවේදී (ගෞරව) කැලණිය.
**මා.ශා.පි/දප/සිං/97/16**

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 710 |
| වර්ග අංකය: | |

කැලණිය විශ්වවිද්‍යාලයේ, සිංහල අධ්‍යයන අංශයේ "දර්ශනපති" උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධයයි.

කැලණිය විශ්වවිද්‍යාලය

2009

# හැඳින්වීම

සිංහල ගැමි බෞද්ධයන්ගේ විවිධ අපේක්ෂා සාක්ෂාත් කර ගැනීම උදෙසා විවිධ වත් පිළිවෙත් පැවැත්වීම අතීතයේ සිට පැවත එන බවට සාධක ඇත. විශේෂයෙන් ම ගැමි බෞද්ධයන් අතර පවතින ඇදහිලි විශ්වාස අතර බලි, තොවිල්, කංකාරි, මඩු ශාන්තිකර්ම යන අභිචාර විධි විශේෂිත ය. ලෞකික දිවියේ විවිධ අරමුණු මුදුන්පත් කර ගැනීම මූලික අභිප්‍රාය කර ගත් ගැමි ජනතාව නිසි කලට වේලාවට තම වත්පිළිවෙත් ඉටු නොකළහොත් අදෘශ්‍යමාන බලවේගයන්ගේ පීඩනයන්ට ගොදුරුවෙතැ යි යන විශ්වාසයක් ද පවතී. මිනිසාට ඇති වන විවිධ අතුරු අන්තරායන්ගෙන් ආරක්ෂා වීම සඳහා ඔවුන් තම තමන් අදහන ආගම්වලින් පිහිට පැතූහ. එපමණක් නොව ජීවත් වීමේ දී ඇති වන්නා වූ විවිධ රෝගෝපද්‍රවයන්ගෙන් ආරක්ෂා වීමට කිසියම් අදෘශ්‍යමාන බලවේගයන්ට මූලික වන්නා වූ යක්ෂ/දේව ඇදහීම්වලින් ද පිහිට පැතූහ.

මෙසේ අප අධ්‍යයනයට තෝරා ගත් කඩවර ඇදහිල්ල සහ කඩවර කංකාරිය ගැමි ජනතාවගේ දැඩි විශ්වාසයට පාත්‍ර වූ අභිචාරයකි. කඩවර ඇදහිල්ල වටා ගොඩනැඟුණු විවිධ වත්පිළිවෙත් උඩරට සම්ප්‍රදයේ ශාන්තිකර්ම අතර ප්‍රචලිත ය. මේ අනුව අපගේ ක්ෂේත්‍ර පර්යේෂණයෙන් ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි ගොඩනැඟුණු ඇදහිලි විශ්වාස සිරිත්විරිත් සාරධර්ම පාදක කොට ගෙන ඉටු කෙරෙන්නා වූ අභිචාර විධි අතර කඩවරයාට සුවිශේෂ ස්ථානයක් හිමි ව ඇති බව තහවුරු කළ හැකි ය.

කඩවර දෙවියා, කඩවර යකා, කඩවර මුත්තා, කඩවර උන්නැහේ, යන නම්වලින් මෙම භූතාත්මය හැඳින්වේ. කඩවර, යක්ෂ/දේව යන ද්වි ස්වභාව ඇති භූතාත්මයකි. උගතුන් දක්වන අන්දමට පුර පක්ෂයේ දී කඩවර, දෙවියකු ලෙසත් අව පක්ෂයේදී යක්ෂයකු ලෙසත්, ගැමි බෞද්ධ ජනතාවගේ ගෞරවාචාරයට ලක්ව ඇති බව පෙනේ. ජනශ්‍රැති විද්‍යාත්මකව සලකන කල කඩවර, වැව් ගම්වාසීන්ගේ නොයෙකුත් ඉතිහාසගත කතා ප්‍රවෘත්තිවලට පාදකව ඇති බව පෙනීයයි. කඩවර නාම විශාල සංඛ්‍යාවක් භාවිතයේ පවතින අතර, සිංහල ශාන්තිකර්මයන්හි කඩවර පුද පිදවිලි ලබන බව පැහැදිලි ය. කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ දී කඩවර තිස් දෙදෙනෙක් පිදුම් ලබති. කඩවරයා වෙනුවෙන් ම පවත්වන ශාන්තිකර්මය වන්නේ කඩවර කංකාරිය යි.

කඩවර කංකාරිය, කඩවර නැටීම, කඩවර යකුම, හැන්දෑ කඩවර නැටීම වැදියක් කංකාරිය, කඩවර ශාන්තිය, කඩෝර නැටීම යන නාමයන්ගෙන් හැඳින්වෙන ශාන්තිකර්ම කඩවර අභිචාරයන් ලෙස හැඳින්විය හැකි ය. දළ කඩවර කංකාරිය, සීරි කඩවර කංකාරිය, මල් කඩවර කංකාරිය, සොහොන් කඩවර කංකාරිය, කළු කඩවර කංකාරිය, කුමාර කඩවර කංකාරිය, රති කළු කඩවර කංකාරිය යන සත්වැදෑරුම් කංකාරි වයඹ පළාත, නුවරකලාවිය හා මාතලේ ආදී ප්‍රදේශයන්හි ප්‍රචලිත ව ඇත. එහෙත් ඇතැම් කඩවර කංකාරි පරම්පරාවක මල් කඩවර කංකාරිය වෙනුවට තොට කඩවර කංකාරියත්, කුමාර කඩවර කංකාරිය වෙනුවට හැන්දෑ කඩවර කංකාරියත් පවත්වන බව පෙනේ.

මෙහි දී අපගේ මූලික අවධානය යොමු කර ඇත්තේ හැන්දෑ කඩවර කංකාරි ශාන්තිකර්මය කෙරෙහි ය. දහවල් දොළහට ආරම්භ කරන මෙකී ශාන්තිකර්මය රාත්‍රී 11.00 ට පමණ අවසන් වේ. කඩවර කංකාරියට ආවේණික පෙළපාළි අංග මෙහි අන්තර්ගත ව ඇති අතර, ඇතැම් ගායන, වාදන හා නර්තන අංග කොහොඹා කංකාරිය හා සාම්‍යයක් දක්වයි. අප උපන් සත්කෝරළ ප්‍රදේශයට අයත් දේවමැදි හත්පත්තුවේ කඩවර කංකාරිය ආරම්භ වී ඇති බව ජනශ්‍රැතිගත තොරතුරු අනුව පැවසේ.

දේවමැදි, වෑඋඩවිල්ලි, දඹදෙණි, කටුගම්පල, හිරියාල, වන්නි, දෙමළ යන හත් පත්තු හත එක්වීමෙන් සැදි සත්කෝරළය කඩවර කංකාරිය සඳහා ප්‍රසිද්ධ සංස්කෘතික වටිනාකමකින් යුක්ත විෂය ක්ෂේත්‍රයේ කෙම්බිමක් වශයෙන් හැඳින්විය හැකි ය. මෙම ශාන්තිකර්මය ව්‍යාප්ත ව ඇති පළාත් වශයෙන් වයඹ පළාත, මධ්‍යම පළාත හා උතුරුමැද පළාත විශේෂිත ය. කඩවර ශාන්තිකර්ම, පළාත් ප්‍රදේශ හෝ ගුරුකුල අනුව වෙනස්කම් ප්‍රකට කරයි. සිංහල දේව පන්තිය තුළ කඩවරයා වෙනුවෙන් වෙනම ම ශාන්තිකර්මයක් දැක ගත හැකි වන්නේ උඩරට සම්ප්‍රදයේ පමණි.

අපගේ ක්ෂේත්‍ර පර්යේෂණයට අයත් සහභාගිත්ව නිරීක්ෂණයේ දී ශාන්තිකර්ම නැරඹීම ප්‍රධාන පරමාර්ථයකි. එකී ශාන්තිකර්ම නරඹා අන්තර්ගතයන් පැහැදිලි කර ගනිමින් ඉතා විශේෂිත නර්තන, ගායන හා වාදන අංග විද්‍යුත් මාධ්‍ය උපයෝගී කොට ගෙන නිරීක්ෂණය කරමින් තොරතුරු එක්රැස් කර ගන්නා ලදී. කඩවර ඇදහිල්ලට හා කඩවර කංකාරියට ප්‍රසිද්ධ ගුරුකුල ඇදුරු සමූහයාගේ විෂයානුබද්ධ තොරතුරු සහ කඩවර දේවාල ප්‍රධානීන්ගෙන් ලබා ගත් තොරතුරු මගේ අධ්‍යයන කාර්යය සඳහා ඉවහල් කරගෙන ඇත. ජනශ්‍රැතියේ එක් අංගයක් වන ඇදහිලි හා විශ්වාස යටතේ කඩවර යක්ෂ/දේව වන්දනය වෙනුවෙන් ඉටු කෙරෙන්නා වූ සියලු අභිචාර විධි පිළිබඳව අධ්‍යයනයක නිරත වීම්.

මෙහි පළමු පරිච්ජේදයෙන් කඩවර සංකල්පය හඳුන්වනු ලැබේ. මේ යටතේ කඩවර අර්ථ විග්‍රහය, කඩවර පිළිබඳ දේශීය හා විදේශීය උපත්කතා, කඩවර සම්බන්ධ නාම සහ සංඛ්‍යා ප්‍රභේද පිළිබඳව විස්තර ඉදිරිපත් කෙරේ.

දෙවන පරිච්ජේදය කඩවර ඇදහිලි හා විශ්වාස සඳහා වෙන් කෙරේ. මේ යටතේ කඩවර ඇදහිලි පවත්නා ප්‍රදේශ, කඩවරයා ඇති කරන ලෙඩ රෝග සහ පුදපූජා පවත්වන ස්වරූප විස්තර කර ඇත.

තෙවන පරිච්ජේදයේ දී කඩවර කංකාරි ශාන්තිකර්මය සහ එහි පූජාවිධි හඳුන්වා ඇත. මෙහි දී පූර්ව චාරිත්‍රවිධි සහ කඩවර කංකාරියේ ප්‍රධානතම පෙළපාළි අංග පිළිබඳව හැඳින්වීමක් කර ඇත. මේ සියලුම පෙළපාළි අංග ගුරුකුල සම්ප්‍රදයන් හතරක් යටතේ විස්තර කෙරේ.

සිවුවන පරිච්ඡේදයෙහි එකී ගුරුකුල ආශ්‍රිත ව පවත්නා විශේෂතා හඳුන්වා ඇත. මෙහි දී වයඹ පළාතේ ප්‍රසිද්ධ ගුරු පරම්පරා තුනක් සහ මධ්‍යම පළාතේ එක් ගුරුකුලයක් ආශ්‍රිතව පවත්නා සුවිශේෂතා පිළිබඳව විස්තර ඉදිරිපත් කර ඇත. ඉන් අනතුරුව සමස්ත සමාලෝචනයක් ඉදිරිපත් කෙරේ.

උපග්‍රන්ථයට අදාළව මහනාන්නේරිය පරපුරට අයත් කුකුළා යක්කමට අයත් කවි, නාරම්මල සිරිල් ගුරුතුමාගේ අත්පිටපත්වලින් ලබා ගත් කඩවර ගොටුවේ කවි සහ කලාවැව හා සම්බන්ධ කවි ඉදිරිපත් කර ඇත. මීට අමතරව ජාතික කෞතුකාගාර පුස්තකාලයේ පුස්කොළපොත්වලින් ලබා ගත් කඩවර පුවත, කඩවර යකා බඳින කවි, කළුදෑ කඩවර කෝල්මුර කවි, ඉනාමාලය සහ තොට කඩවර අස්න, දළ කඩවර ගොටු දෙන කවි සහ කඩවර යාදින්න උපග්‍රන්ථයට ඇතුළත් කර ඇත.

කඩවර ශාන්තිකර්මවල ගැයෙන කවි අඩංගු මුද්‍රිත කෘති කිහිපයක් ද මේ සඳහා උපයෝගී කරගැනුණ අතර, ඒවා නම් වශයෙන් සඳහන් කර ඇත. හෙළ ජන ගී, කංකාරි ගීත සාහිත්‍යය, උඩරට කඩවර ශාන්තිකර්මය, උඩරට නැටුම් කලාව සහ කොහොඹා කංකාරිය යානාදිය යි. අවසන් වශයෙන් සම්ප්‍රදයික කලා ශිල්පියෙකු වූ අහුගොඩ ඩිංගිත්තා ගුරුතුමාගේ අත්පිටපත්වලින් ලබා ගත් කවි සහ කඩවර මන්ත්‍රයක් ද ඉදිරිපත් කර ඇත. කොහොඹා කංකාරියෙහි ගිරි දොළහට ගැයෙන කවි ගායනා ද අන්තර්ගත වේ. සත්කෝරළයේ තෙංගඩගම කඩවර ගුරු පරම්පරාවට අයත් කඩවර කංකාරියේදී ගිරි දොළහට ගැයෙන කවි එලෙසින්ම කෙහොඹා කංකාරියේදී ගායනා කරනු ලැබේ. ආශ්‍රිත ග්‍රන්ථාවලිය සහ කඩවර කංකාරියට අදාළ ඡායාරූප ඇතුළත් චිත්‍රාවලියක් අවසන් වශයෙන් දැක්වේ.